මාන්තෙයි බටහිර ප්‍රාදේශිය සභාව
මන්නාරම දිස්ත්‍රික්කය
----------------------------------------

1. මූල්‍ය ප්‍රකාශන
------------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
----------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 30 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 26 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 ජනවාරි 24 වන දින ද සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
----------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට මාන්තෙයි බටහිර ප්‍රාදේශිය සභාවේ මූල්‍යය තත්ත්වය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දන්නා මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්
------------------------------------------

1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති
--------------------------

පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශ ලේකම්ගේ 2014 ජනවාරි 27 දිනැති පීඑල්/05/පීඒ/එස්එෆ්පීඑස්ඒඑස් අංක දරණ චක්‍ර ලේඛය පරිදි රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු
------------------------

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) ප්‍රවර්ථන වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල සමුච්චිත ලාභය හා සංචිත වල ආරම්භක ශේෂය රු. 1,916,700 කින් වැඩිපුර ඉදිරියට ගෙනවිත් තිබුණි.

(ආ) ප්‍රවර්ථන වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල අයිතම 17 කට අදාලව එකතුව වූ රු. 571,279 ක් වැරදි ලෙස වර්ග කර තිබුණි.

1.3.3 පියවිය යුතු ගිණුම්
---------------------

ප්‍රවර්ථන වර්ෂයේ අයිතම 18 කට අදාලව පියවිය යුතු රු. 1,187,388 ක් නිරවුල් කිරීමට අවශ්‍ය පියවර සභාව මගින් ගෙන නොතිබුණි.

1.3.4 නීති , රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම්
---------------------------------------------------

පහත දැක්වෙන නීති , රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම් විගනණයේදී නිරීක්ෂණය විය.

| නීති , රීති හා රෙගුලාසි සඳහා යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) 1988 ප්‍රාදේශීය සභා රීති සංග්‍රහය | |
| I. රීති අංක 5 (XII) | මූල්‍ය හා ගබඩා ගණුදෙණු පිළිබඳ වගකිව යුතු නිළධාරීන් වෙතින් ප්‍රමාණවත් ඇපකර ලබාගෙන නොතිබුණි. |
| II. රීති අංක 178 (3) | අනුමත ආයතන හා කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ ලේඛණයක් පිළියෙල කර නොතිබුණි. |
| III. රීති අංක 218 | සභාවේ සභාපති , කාර්මික නිළධාරී සහ සභාවේ ලේකම්වරයා බලය පවරන ලද කවර හෝ නිළධාරියකු ලවා සෑම වර්ෂයකටම වරක් සභාව විසින් ප්‍රයෝජනයට ගනු ලබන සියළුම ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳ පරීක්ෂාවක් සිදුකල යුතු වුවත් මෙම වාර්තාවේ දිනය දක්වා එසේ සිදුකර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාත්‍රාන්තික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| I. මුදල් රෙගුලාසි 371 | 2013 සිට 2015 වර්ෂය දක්වා ලබා දුන් රු. 175,741 ක් වටිනා අත්තිකාරම් මුදල් නිරවුල් කර නොතිබුණි |

2. මූල්‍ය සමාලෝචනය
-----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵලය
-----------------

ඉදිරිපත් කරන මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 3,225,215 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 5,448,700 ක් විය. මේ අනුව ප්‍රවර්ථන වර්ෂයේ රු 2,223,485 කින් මූල්‍ය ප්‍රතිඵලය පහත බැසීමක් ඇති වී තිබූ අතර පුනරාවර්තන වියදම් හා ප්‍රාග්ධන වියදම් වැඩිවීම ඊට හේතු වී තිබුණි.

## 2.2 ආදායම් කළමණාකරණය

### 2.2.1 ආදායම් රැස්කිරීමේ ප්‍රගතිය

සභාව විසින් ප්‍රවර්ථන වර්ෂය වෙනුවෙන් අයවැය ගත කළ ආදායම හා රුස්කල සත්‍ය ආදායම අතර රු. 11,416,793 ක වෙනසක් නිරීක්ෂණය විය.

### 2.2.2 බදු කුලී

සභා බල ප්‍රදේශයට අයත් කඩ වලින් අයවිය යුතු හිඟ බදු කුලී රු. 861,689 ක මුදල අයකර ගැනීමට සැලකිය යුතු පියවරයන් සභාව විසින් ගෙන නොතිබුණි.

### 2.2.3 මුද්දර ගාස්තු

රෙජිස්ටාර් ජනරාල් දෙපාර්තමේන්තු වෙතින් සභාවට ලැබිය යුතු රු. 11,078,437 ක මුද්දර ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 2.2.4 අනෙකුත් ආදායම්

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කෙරේ.

(අ) සභාවේ අධිකාරී බල ප්‍රදේශයට අයත් දුරකථන සම්ප්‍රේෂණ කුළුණු 04 කින් ඉදිකිරීම් අනුමත කිරීමේ ගාස්තු අයකර ගැනීමට සැලකිය යුතු පියවරයන් ගෙන නොතිබුණි.

(ආ) සභාවේ අධිකාරී බල ප්‍රදේශයට අයත් විවිධ ප්‍රභවයන්ගෙන් ලැබිය යුතු රු. 908,164 ක ආදායම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධන වාර්තාව

මහා භාණ්ඩාගාර අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ 2010 මාර්තු 10 දිනැති හා අංක PF/R/2/2/3/5/(4) දරණ ලිපියෙහි 1:4:1 ඡේදය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාවක් සකස් කළ යුතු වුවත් 2016 අගෝස්තු 10 දින දක්වා සභාව මගින් කාර්යසාධන වාර්තාවක් පිළියෙල කර නොතිබුණි.

### 3.2 කොන්ත්‍රාත්තු පරිපාලනය

(අ) අඩම්පන් ක්‍රීඩා පිටිය සංවර්ධනය කිරීම - 2015

සත්‍ය වශයෙන් සිදුකල වැඩ ප්‍රමාණයන් සමඟ මැනුම් පත්‍ර පරීක්ෂා කිරීමේදී ඇතැම් වැඩ කටයුතු සිදු නොකර රු. 160,700 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.

(ආ) පෙරියපන්ඩිවිරිච්චාන් හි නළලිද ඉදිකිරීම , පානීය ජල ටැංකිය ඉදිකිරීම හා ජල නල එලීම
--------------------------------------------------------------------------------------------------

i. ඉහත ව්‍යාපෘතිය සඳහා සහකාර පලාත් පාලන කොමසාරිස්ගේ අංක NP/14/42(1)/PSDG/MWPS/CTW & WT/2012 හා 2012 අගෝස්තු 17 දිනැති ලිපිය ප්‍රකාරව විවෘත ප්‍රසම්පාදන හරහා කොන්ත්‍රාත්තුව සිදුකරන ලෙස දන්වා තිබුණ ද වෙළෙඳපොල සැසඳුම් මිල ක්‍රමය හරහා කොන්ත්‍රාත්කරු තෝරාගෙන කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි.

ii. තාක්ෂණික ඇගයීම් කමිටුවේ, තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාව රහිතව ඉහත ව්‍යාපෘතිය අනුමත කර තිබුණි.

iii. ඉහත ව්‍යාපෘතිය පිරිනැමීමට ප්‍රසම්පාදන ඇගයීම් කමිටුවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

iv. ඉහත කොන්ත්‍රාත්තුවෙහි ප්‍රමාණ පත්‍ර සකස් කිරීමේදී රේට සකස් කළ ආකාරය දක්වා නොතිබීමෙන් වතුර මෝටරයක් සපයා සවිකිරීම හා නළ ලිඳක් ඉදිකිරීම සම්බන්ධයෙන් වන රු. 650,000 ක හා රු. 200,000 ක වටිනාකම් කුමන පදනම මත ඇස්තමේන්තු ගත කලේ ද යන්න හඳුනා ගැනීමට නොහැකි වී තිබුණි.

v. ඉහත කොන්ත්‍රාත්තුවෙහි සවිකල වතුර මෝටරයෙහි වෙළඳපොල වටිනාකම හා ඇස්තමේන්තු ගත වටිනාකම අතර රේටයන් සැසඳීමේදී ඇස්තමේන්තු ගත වටිනාකම රු. 605,000 කින් වැඩිපුර ඇස්තමේන්තුගත කර තිබුණි.

vi. ඉහත කොන්ත්‍රාත්තුවට අදාලව සපයා සවිකල වතුර මෝටරයෙහි වගකීම් සහතිකය කොන්ත්‍රාත්කරු විසින් සභාව වෙත ලබා දී නොතිබුණි.

vii. ඉහත කොන්ත්‍රාත්තුව 2012 වර්ෂයේදී රු. 2,500,000 ක වියදමක් දරා නිමකර තිබුණද විදුලිය සැපයීම සිදුකර නොතිබීමෙන් 2016 වර්ෂය දක්වා වූ වර්ෂ 04 ක කාලය තුල ප්‍රතිලාභීන් හට පානීය ජලය සැපයීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි.

viii. පෞද්ගලික ඉඩමක නළ ලිඳ ඉදිකිරීම හා වතුර මෝටරය සපයා සවිකිරීම සිදුකර තිබුණි.

(ඇ) පෙරියපන්ඩිවිරිච්චාන් පානීය ජල ටැංකිය ඉදිකිරීමේ අතිරේඛ වැඩ - 2012
------------------------------------------------------------------------------------

ඉහත කොන්ත්‍රාත්තුව සඳහා සත්‍ය වශයෙන් සිදුකල කාර්යයන් සමග ප්‍රමාණ පත්‍ර පරීක්ෂා කිරීමේදී රු. 100,810 ක් වටිනා මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.

4. යහපාලනය හා ගිණුම් කටයුතුභාවය
----------------------------------------

අයවැය පාලනය
-------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කෙරේ.

(අ) ප්‍රවර්ථන වර්ෂයේදී මූලධන වැය විෂයන් 38 කට අදාලව ප්‍රතිපාදනය කරන ලද රු.13,200,027 ක් වටිනා මුදලක් ඉතිරි කර තිබුණු අතර එය මුළු ප්‍රතිපාදනයෙන් සියයට 40 සිට සියයට 100 දක්වා විය.

(ආ) ප්‍රවර්ථන වර්ෂයේදී මූලධන වැය විෂයන් 22 කට අදාලව ප්‍රතිපාදනය කරන ලද රු. 1,114,272 ක් වූ ප්‍රතිපාදන වෙන්කිරීම් ඉතිරි කර තිබුණි.

(ඉ) සභාව විසින් ප්‍රවර්ථන වර්ෂයේදී මූලධන වැය විෂයන් 05 ක් සඳහා වූ රු. 568,654 ක වියදම සඳහා ප්‍රතිපාදන අයවැය ලේඛණය මගින් අයවැය ගත කර නොතිබුණි.

5. පද්ධති හා පාලන

--------------------

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ආදායම් එකතු කිරීම
(ආ) අයවැය පාලනය
(ඇ) ලැබිය යුතු ගිණුම්
(ඈ) තොග පාලනය
(ඉ) ගිණුම්කරණය